# දෝතළු කන්ද පාමුල

සුනිලා විජේසිංහ



ජාතික විද්‍යා පදනම

# දෝතළු කන්ද පාමුල

සුනිලා විජේසිංහ

චිත්‍ර
අනුර ශ්‍රීනාත්

NATIONAL SCIENCE FOUNDATION

**ප්‍රකාශනය**
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

© ජාතික විද්‍යා පදනම 2009

**ISBN 978-955-590-102-4**

ප්‍රකාශන සම්බන්ධීකරණය: නදීරා ජයවීර
අකුරු සැකසුම සහ පිටු නිර්මාණය: දිමුතු ජයමාලි වීරසූරිය

මුද්‍රණය
ජාතික විද්‍යා පදනම - මුද්‍රණ අංශය

ආදරණීය දුවේ, පුතේ,

මේ කතන්දරය නාය යෑම් පිළිබඳවයි. නාය යෑම් අපට බහුලව දක්නට ලැබෙන ස්වභාවික ක්‍රියාවලියක්. අපේ රටේ බහුලව ඇති වන ස්වභාවික විපත් පිළිබඳව ඔබව දැනුවත් කිරීම අපේ වගකීමක්. මෙවැනි ආපදා පිළිබඳව දැනුවත් වීම මගින් ඉන් අපට හා රටට සිදුවන දේපල, ජීවිත හානිය අඩු කර ගන්න පුළුවන්.

ජාතික විද්‍යා පදනම, දූ දරුවන් වෙනුවෙන් ස්වභාවික ආපදා පිළිබඳව කතන්දර පොත් පෙළක් පළ කරන්න තීරණය කළේ මේ නිසයි.

සුනාමියට පසු ඒ පිළිබඳව ලියැවුණු 'මුහුද කළු වුනා' පොත අපේ පොත් පෙළේ පළමු පොත ලෙස ප්‍රකාශයට පත් කළා. ඒ පොත හුඟාක් ජනප්‍රිය වුනා. ළමා පොතක් ලෙසට සාහිත්‍ය සම්මානයෙනුත් පිදුම් ලැබුවා.

ආදරණීය දුවේ පුතේ අපි ස්වභාවික ආපදා පිළිබඳව හොඳින් දැනුවත් වෙමු.

මේ කතන්දරය දෝතළු කන්ද පාමුල ජීවත් වන ගම්වැසියන්ට මුහුණ පෑමට සිදුවන ස්වභාවික විපතක් පිළිබඳවයි. අධික වර්ෂාවක් සමග පරිසරයෙහි සිදු වූ වෙනස්කම් ගැන සැලකිළිමත් වූ ගම්වැසියන් නාය යෑමක් පිළිබඳ අවදානමක් ඇතැයි ඊට වගකිවයුතු ආයතන දැනුවත් කරනවා. නියමිත වේලාවට සිදු කළ දැනුම් දීම් හා ක්‍රියාත්මක වීම් නිසා දෝතළු කන්ද නාය යෑමට පෙර ගම්වැසියන් වෙනත් ආරක්ෂිත ස්ථාන වලට ගොස් සිදුවන්නට ගිය විශාල ජීවිත හානි ප්‍රමාණයක් වළක්වා ගන්නට සමත් වෙනවා.

මේ කතන්දරය කියවා ඔබත් හොඳින් දැනුවත් වන්න. ඔබ ඉගෙන ගත් දෙය ගැන ඔබේ යහළුවනුත් දැනුවත් කරන්න.

ජාතික විද්‍යා පදනම
47/5 , මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07.

ලොව සියලු දූවා දරුවන්ට

ආදරයෙනි...

## 01 වන පරිච්ඡේදය

වැස්ස - මහ වැස්ස...
අතොරක් නැති වැස්ස...

යසෝදානි වැස්සට කැමති ය. ඒ වැසි වසිද්දී ඇඳට වී කවි කියන්නට පුළුවන් නිසයි. ඇය සුපුන් මල්ලී ද කැටුව ඇඳට ගුලි වූවා ය.

''මල්ලියි මමයි
අකුරට යන වෙලාවේ...
කළු කරගෙන
ආවයි වැහි වළාවේ...
මුවාවෙන්ට
ගසකුත් නැති වෙලාවේ...
පමාවෙලා
වැහැපන් වැහි වළාවේ...''

ඇගේ කවිය වැස්ස පිළිබඳව ය. සුපුන් මල්ලී ඉතා සන්සුන් ව

ඇගේ හඬට සවන් දී සිටියි.

''උපන්නේකට දැකලා නැහැ මෙහෙම අනෝරා වැස්සක්...''

ලොකු කුල්ලක් තරමට විශාල වූ හබරල කොළයක් ඉහළාගත් පියසේන මාමා මහ වැස්සේ ම මිදුලට ගොඩ වූයේ ය. හබරල කොළය බිත්තියකට හේත්තු කළ හෙතෙම තාත්තා ළඟින් වාඩි වූයේ දැඩි කණගාටුවකින් ය.

''සුමනසිරි අයිය දන්නව ද? ඊයෙ රෑ නෙළුවෙ කන්ද නාය ගිහින් ලු... ගෙවල් දෙක තුනක් යටවෙලා ලු. පොඩි දරුවො දෙන්නෙකුත් නැතිවෙලා කියලා තමයි ආරංචිය...''

අම්මාත්, තාත්තාත් එකවර කම්පා වූහ.

''අනේ අප්පේ... සොබාදහමත් අරියාදු කරන්නෙ අහිංසකයන්ට ම නෙ.''

''ඇත්තට ම පියසේන මල්ලියෙ, මේ මෑත දවසක නෙළුව කන්ද දැක්කම මට නිකමට අමුත්තක් දැනුණා. ඉස්සර කන්ද පිරෙන්ඩ ම යස අපූරු රබර් යාය නේ.''

''කොළඹ මහත්තයෙකුට වත්ත විකිණුව කියනව නේ...''

''ඒක තමයි, පහුගිය කාලෙ තට්ටෙ ගෑව වගේ රබර් ගස් ටික

ඔක්කොම උගුල්ලල දාල තිබුණෙ. ආපහු ඇල්බීසියා පැළ ටිකක්වත් හිටෙව්වෙ නෑ නෙ. අව්වට වේලි වේලි වැස්සට තෙමි තෙමි කන්ද දිරාපත් වුණා.''

''අපි එහෙම කිව්වට අපේ මේ දෝතළු කන්දත් ඒ විදියයි. ටවුමෙ ලී මුදලාලි තේක්ක ගස් ටික කපා ගෙන ගියා. ආණ්ඩුවෙ කැලේ කොන්ත්‍රාත් ගත්ත කියල යි කිව්වේ ඒ කාලෙ. ආපහු මොනවදෝ පැළ වගයක් හිටෙව්වා. ඒත් කෝ, ඒ එකක්වත් පැළ වුණායැ?''

''පැළයක් හිටෙව්වා කියලා නිකම් බිම ඇනල ගියාට පැළවෙනවාද අයියෙ? ඒක හරි පිළිවෙලට ප්‍රමාණෙට වළවල් කපල පොහොර, වතුර දාල හදා වඩන්න එපායැ...''

කවි ගායනා නවත්වා යසෝදානි වැඩිහිටියන්ගේ කතා බහට සවන් දුන්නා ය.

අසල්වැසි ගමක මහත් විපතක් වී ඇති කළ කුමන කවි ගායනා ද? අම්මා ද වට්ටි වියමන නවතා ඔහේ වැස්ස දෙස බලා සිටියා ය.

පාසලේ දී ගුරුතුමිය ඉගැන්වූ පරිසරය පාඩමක් යසෝදානිට සිහි විය.

''ගස් කපා දැම්මම පස හේදිලා යනව. මතුපිට පස් තට්ටු හේදිලා ගිහින් පස නිසරු වෙනවා.''

''කඳුවල පස හේදිලා යනකොට ගංගා මිටියාවත්වල, නැත්නම් ගඟ පතුලෙ ඒ පස් තැන්පත් වෙනවා. එතකොට ගං වතුර උවදුරු වැඩි වෙනවා. ගංගා දෙපස ඉවුරු හේදිලා යනවා.''

වැඩිහිටියන්ගේ කතා බහ මැදට පැන ඊට හවුල් වීම එතරම් සුදුසු නැත. එබැවින් යසෝදානි පරිසරය පාඩම නැවත සිහිපත් කර ගත්තේ තනිවම ය.

මල්ලීට හොඳට ම නින්ද ගිහින් ය. ඈතින් ගඟ ගලන හෝ.. හෝ.. හඬ යසෝදානි අසා සිටියා ය. ගං ඉවුරු බිඳගෙන බොර වතුර උතුරා යන හැටි ඈ සිතින් මවා ගත්තා ය.
මිදුල කෙළවරට ගියහොත් නම් ගඟ යන්තමින් දැකිය හැකි ය. යසෝදානි වැහි පොද යටින් මිදුල දිගේ ඇවිද ගියා ය. ඈත ගස් කොළන් අතරින් දුඹුරු පාටින් ගඟ ගලා යනු ඈ බලා සිටියා ය.

''ඇත්ත තමයි. ගඟ මේ තරම් බොර වෙන්නට මොන තරම් පස් කන්දක් ගං වතුරට එකතු වෙන්න ඕන ද..?''

ගෙට නුදුරින් අඩි පාර වසාගෙන බොර වතුර කඳක් ගලා යමින් තිබිණි.

''බලන්ඩකො තාත්තෙ, අපේ පාරත් පුංචි ගඟක් වෙලා. මේ ගඟත් අන්තිමට ලොකු ගඟට එකතු වෙනව ඇති.''
''ඒක තමයි. ඒ වතුර පාර දකිනකොට මට බොහොම දුකක්

දැනෙනව.  මම තමයි ඔය අඩි පාර හැදෙන්ඩ ඉඩ ඇරියෙ.  ඒ දවස්වල ලී මුදලාලි කන්දෙන් ගේන ගස් අපේ වත්ත මැදින් පාරට ගෙනියගන්ඩ අවසර ඉල්ලුව.  මම දුන්න.  අන්තිමට හැමදෙනා ම ඒක තාර පාරට යන්ඩ කෙටි මාර්ගයක් කර ගත්තා.''

''ගං වතුර... නාය... එක අතකට මේ හැම උපද්‍රවයකට ම අපිම තමයි වග කියන්ඩ ඕන.''

තාත්තා කතා කළේ වේදනාවෙනි.

''මං මේ කියන්ඩ හිටියෙ අපේ තේ වත්ත මැද්දෙ ටික දවසක ඉඳලා පැල්මක් තියෙනවා.  ඒකෙන් මේකෙන් මට කියන්ඩ අමතක වෙලා ගියා.''  අම්මා එලෙස දෙඩුවේ බිය මුසු සැකයකිනි.

''පියසේන මල්ලිගෙ කොරටුව පැත්තටත් ඒ පැල්ම දුවල තිබුණා. මං හිතුවෙ මී ගහේ මුල් දුවල ද කියලා.''

''මමත් ඕක ඊයෙ පෙරේදා දවසක දැක්කනෙ අක්කෙ.  මටත් පොඩි අමුත්තක් දැනුණා.  ඒත් වැඩ වැඩිකමට ඒ ගැන මතකෙ අකා මකා ගියා.''

''අපේ දෝතළු කන්දත් නාය යයි ද අම්මේ?''  යසෝදනිගේ පුංචි හිතට දැනුනෙ මහා බියක්.

''සමන් දෙවියන්ගෙ පිහිටයි.  අපිට එහෙම වෙන්නෙ නෑ.''



අම්මාගේ වචන ඇගේ පුංචි හිතට තාවකාලික ශක්තියක් විය.

''කොයි එකටත් වැස්ස තුරල් කළා ම අපි කන්ද පැත්තට නැගලා බලමු ද මල්ලියෙ?''
''ඔව්. ඒක කරන්ඩ ම ඕන.'' පියසේන මාමා තාත්තාගේ කතා බහ අනුමත කළේ ය.

තාත්තාත් පියසේන මාමාත් වැස්ස තුරල් වෙද්දී ම ගමනට පිටත් වූහ. වදුළු අතරින් ඔවුන් කන්ද ඉහළට නැග යන අයුරු යසෝදානිත් අම්මාත් මිදුලට වී බලා සිටියහ.

''අම්මේ, අපේ කුස්සියෙ බිත්තියෙත් ලොකු පැල්මක් තියෙනව නෙ.'' යසෝදානි අම්මා කුස්සිය දෙසට කැටුව ගියා ය.

''තාත්ත කියන්නෙ මේ ගේ හුඟාක් පරණ නිසා බිත්තිය පුපුරන්ඩ ඇති කියලා. ඒ නැත්නම් අර දෙල් ගහේ මුල් දුවලා වෙන්න ඇති දුවේ.''

## 02 වන පරිච්ඡේදය

තාත්තා ආපසු ආවේ බොහෝ වේලාවකට පසුව ය. තාත්තාත් පියසේන මාමාත් හැරුනු විට තවත් තුන් හතර දෙනෙක් ම ආපසු පැමිණ සිටියහ.

හැම දෙනාගේ ම මුහුණුවල තිබුණේ කිසියම් කනස්සල්ලකි.

''හොඳටෝ ම මහන්සි පාටයි. මං තේ හදාන එන්නම්.''

අම්මා කුස්සියට ගියේ කේතලය ලිප තබන්නට ය. යසෝදානි හැම විට ම තාත්තාට කිට්ටුවෙන් සිටියේ අළුත් තත්ත්වය කෙලෙස විය හැකි දැයි දැනගන්නට ය.

''අනේ මන්දා මාමෙ, මං නම් හිතන්නෙ අපි හැකි ඉක්මනින් ග්‍රාමසේවක මහත්තයව දැනුවත් කළොත් හොඳයි මේ ගැන.''

ඒ කණ්ඩායමේ හුන් ලාබාල තරුණයාගේ අදහස විය.
''ඇයි පුතේ අර පැල්ම තාම තියෙනව ද? '' අම්මා ද බලා සිටියේ ඒ පිළිබඳව තව දුරටත් කරුණු කාරණා දැනගන්නා නොඉවසිල්ලෙනි.

''තියෙනව විතරක් නෙමෙයි. සෑහෙන දුරට පැතිරිලා. කඳු මුදුනට කිට්ටු වෙනකල් ම අපි ගියා පැල්ම දිගේ.'' තාත්තා ඇසු දුටු දෑ විස්තර කළේ ය.
''මේ ඕව ගැන තාත්තට ඇහෙන්ඩ එහෙම කතා කරනවා නෙමෙයි. ඒ වයසක මනුස්සයා ඕව අහල හිත නරක් කර ගනීවි.''

අම්මා 'තාත්තා' යැයි හැඳින්වූයේ තාත්තාගේ තාත්තාය. එනම් යසෝදනිගේ සීයාය. ඈ ඉස්තෝප්පු කාමරයේ හිඳින සීයා බලන්නට ගියා ය.

''සීයා නිදි.''

වැහි දිනවල සීයා බොහෝ විට කරන්නේ ඇඳෙහි වැතිරී ජනේලයෙන් වැස්ස දෙස බලා සිටීම ය. එසේ හිඳින විට සීයාට නොදැනීම නින්ද යයි.

කොහොමටත් සීයාට එහේ මෙහේ ඇවිද යාම අපහසු ය. ඒ ඇවිද යන්නේ ද හැරමිටියේ වාරුවෙනි.

සීයා පරිසරයට බොහෝ සේ ආදරේ ය. රජයේ කැලෑවේ ගස්



කපා කන්ද පහළට ගෙන යද්දී ඔහු කෝපයෙන් වෙවුලමින් බලා සිටියා යසෝදානිට මතක ය. ඔහු ඒ පිළිබඳ ව රජයේ නිලධාරීන් හට නිතර දෙස් දෙවොල් තැබුවේ ය.

අම්මා පැමිණ සිටි සැමට ම කිතුල් හකුරු සමග තේ දුන්නා ය. අනතුරුව පිරිස සමග තාත්තා ද පහළට බැස යන අයුරු යසෝදානි පඩිපෙළ මුදුනට වී බලා සිටියා ය. ඔවුන් යන්නට ඇත්තේ ග්‍රාමසේවක මහත්මයා මුණ ගැසෙන්නට විය යුතු ය.

ඒ අතර එහා ගෙදර සුදු නැන්දා වැටෙන් පැන මිදුලට ආවා ය. ඇයට ද ආරංචිය ලැබී ඇතිවා විය යුතු ය.

''නෙළුවෙ නායෙන් පස් දෙනෙක් මැරිල ලු...''
''අනේ අප්පේ...''

අම්මාත්, සුදු නැන්දාත් ඛේදවාචකය පිළිබඳව එකට එක් වී කම්පා වූහ.

''අපටත් ගම රට දාල යන්ඩ වේද දන්නෙත් නෑ.''

''අනේ මන්දා සුදු අක්කෙ. තාම දවාලට උයන්ඩ ගත්තෙත් නෑ. හැලියක් ලිප තියා ගන්ඩවත් හිත දෙන්නෙ නෑ. අරෙහෙන් ළඟ පාත ගමක මරණ. මෙහෙන් අපිට ගෙවල් දොරවල් දාල යන්ඩ වේද කියන බය සැකේ.''

''මට දුක මේකයි නංගියෙ,  කැලෙන් අපි ගත්තෙ දර කෑල්ලක්, බේතක් හේතක් විතරයි.  ඒත් ගහක කොලේකටවත් රිදවන්නෙ නැතුව.''

යසෝදානි තෙත පඩිපෙල මත වාඩි වී කතා බහට සවන් දී සිටියා ය.

''හෙමින් සැරේ මොනව හරි රත් කරල ගන්ඩකො නංගියෙ.  මම පොඩි එකාටයි, තාත්තටයි උයාපු මොනවත් ගේන්නම්...''

සුදු නැන්දා ආපසු වැටෙන් පැන ගියා ය.  තවත් ටික වේලාවකින් ඇය නැවත ආවේ ලොකු බත් පිඟානක් ද අරගෙන ය.  එය සීයාටත්, මල්ලීටත් හැරුණු විට යසෝදානිටත් හොඳට ම ප්‍රමාණවත් විය.

සුදු නැන්දාගේ කොස් තැම්බුමත්, කිරි හොද්දත්, හාල් මැස්සන් බැදුමත් කවදාටත් බොහෝම රස ය.

''මේ අසල්වාසි නෑ හිත මිතුරන් සියලු දෙනා හට දුරස් ව යන්නට සිදු වේ ද?''

## 03 වන පරිච්ඡේදය

ග්‍රාමසේවක මහත්තයා හිතුවාටත් වඩා ඉක්මනින් ක්‍රියාත්මක වී තිබුණි. පළමුවෙනි දවසේ ම ප්‍රාදේශීය ලේකම්වරයා ගමට පැමිණ කරුණු කාරණා සොයා බැලුවේ ය. දෙවන දවසේ දහවල් වන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් දෙදෙනෙක් ද ප්‍රාදේශීය ලේකම්තුමා ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරියෙක් ද ගමට පැමිණියහ. ඔවුහු නොපමාව පරීක්ෂණ කටයුතු ආරම්භ කළහ.

''හවස හතර ට පන්සලේ රැස්වීමක් ලු. ග්‍රාමසේවක මහත්මයා හැමෝට ම එන්න කිව්වා.''

තරුණයෙක් ගම පුරා පණිවුඩයක් රැගෙන ගියේ ය. හැබෑවටම හවස හතර වන විට ගමේ අයගෙන් වැඩි දෙනෙක් පන්සලේ ධර්ම ශාලාවට රැස්ව සිටියහ.

''අප පරිසරයට එරෙහි වුවහොත් පරිසරය අපට විරුද්ධ ව නැගී

සිටින බව පැමිණ සිටි හැම නිලධාරියෙකු ම අවධාරණය කළේ ය.''


''රට ගැන - පරිසරය ගැන- සොබාදහම ගැන නොතකන පුද්ගලයින් නිසා අපට ස්වභාවික ව්‍යසනයන්ට මුහුණ දෙන්නට සිදු වෙනවා. මේ අතරින් ජල ගැලීම්, ලැව් ගිනි හා නාය යෑම් ප්‍රධාන වෙනවා.''

''කැලෑ එළි කිරීම්, ගිනි තැබීම් වැනි මානව ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් හැටියට නාය යෑම් වැනි අයහපත් දෑ අපට අත් විඳින්නට සිදු වෙනවා.''

''කෙසේ වෙතත් ඔය මහත්වරු මේ ග්‍රාමසේවක මහත්මයාත් එක්ක මේ විදියට ක්‍රියාත්මක වීම ඉතාමත් ම අගේ කළ යුතුයි. එය ඉතාමත් වැදගත්. ඒ වගේම ඔය අයගෙ වාසනාවක්.''

''ඉතින් අම්මේ, තාත්තේ, සහෝදර සහෝදරියනි, කණගාටුවෙන් වුනත් අපි ඔබට සැබෑ තත්ත්වය දන්වා සිටිය යුතුයි. අප පරීක්ෂාවට ලක් කළ ඒ ප්‍රදේශය ඇත්තට ම නාය යාමේ තර්ජනයට මුහුණ දී සිටිනවා. අප නම් කර සිටින පවුල් කිහිපය තාවකාලික ව වෙනත් නවාතැන් පොළක රැඳිය යුතුයි කියා අප අදහස් කරනවා. ඒ අය පිළිබඳව අප හැකි ඉක්මනින් ගැළපෙන ක්‍රියාමාර්ගයක් ගන්නවා.''

අවසානයට කතා කළ නිලධාරියාගේ එම කතා බහත් සමඟ මුළු සභාව ම කලබල විය. රැස්ව සිටි සියලු ම දෙනා නොසන්සුන් වූහ. කණින් කොණින් ලැබී තිබූ ආරංචි අනුව එය අළුත් ම අළුත්



ආරංචියක් නොවී ය. එහෙත් ඉහළට ගත් හුස්ම පහත හෙළන්නට අමතක වූවා සේ සියල්ලෝ ම තුෂ්ණිම්භූත ව බලා සිටියහ. ග්‍රාමසේවක මහතා නම් පෙළක් කියවාගෙන ගියේ ය.

''ආර්. ඒ. පියසේන''
''එල්. ඒ. සුදු මැණිකේ''
''ඒ. එම්. ආර්. සුමනසිරි''

ඒ තාත්තාගේ නම ය.

යසෝදානි වාඩි වී සිටියේ අම්මාගේ දකුණු පසට වන්නට ය. ඈ හිස හරවා අම්මාගේ මුහුණ බැලුවා ය. ඒ ඇස් පාමුල කඳුළු දිලිසිණ. ඈ වම් පසින් වාඩිවී හුන් සුදු නැන්දාගේ මුහුණ බැලුවා ය. ඒ ඇසුත් එලෙසම ය. දුකින් වේදනාවෙන් පිරී ගොසින් ය. හරියට කිට්ටුවන්ත ඥාතියෙක් මිය ගිය දාක සේ ය.

පන්සලේ ධර්ම ශාලාව නොසන්සුන් බවින් පිරී ගියේ ය.

''ගස් කැපුවෙ අපි නෙමෙයි මහත්තයො. උන් වටුමෙ බංගලාවල පදංචි වෙලා ඉන්න කෝටිපතියො. ඒත් සොබා දහම දඬුවම් දෙන්නෙ කැලේ ආරක්ෂා කරන අපට. කැලේට දරුවෙකුට වගේ ආදරය කරන අපිට.''

වේදනාවත්, කෝපයත් එකට කැටි වූ තාත්තාගේ කටහඬ යසෝදානි වෙන්ව හඳුනා ගත්තා ය.

## 04 වන පරිච්ඡේදය

යසෝදානිලා පන්සලේ බණ මඩුවේ තාවකාලික පදිංචියට ආවේ එලෙස ය.

''උඹලා කොච්චර පිංසෙණ්ඩු වුනත් මං එන්නේ නෑ. මේක මගේ උපන් ගේ. මං මැරෙන්නෙත් මේකෙමයි. කන්ද කඩන් වැටුනොත් යට වෙලා මැරෙනව. මේ කන්දත් මගේ ම ජීවිතේ කොටහක් තමයි.''

සීයා ගේ හැර යන්නට අකමැති වූයේ ය. අවසානයේ දී තාත්තාට ද සීයාගේ තනියට නවතින්නට සිදු විය.
වටිනා කියන දේත්, ඇඳුම් පැලඳුම් කිහිපයකතුත් පමණක් රැගෙන යසෝදානිලා පිටත් වූහ.

''වැහි දවස් ටික ඉවර වුනාම අපි ආපහු එනව දුවේ.''

අම්මා යසෝදානිව සනසන්නට උත්සාහ කළා ය.
මල්ලීට නම් මේ කිසි දෙයක බරපතලකමක් වැටහුනේ නැත. ගම හැර යන පෙරහැරට එක්ව ඔහු ගමන් කළේ සතුටිනි.

එහෙත් හයවන වසරේ සිසුවියක් වූ යසෝදානි සියලු සිදුවීම් පිළිබඳව අවබෝධයෙන් හා අවධානයෙන් සිටියා ය. වේදනාව සෝදා හරින්නට සේ ඇය ඉකි ගසා ඇඬුවා ය.

ඒ රාත්‍රිය ඉතා දිගු විය. යසෝදානිට එය ඇගේ ජීවිතයේ දිග ම රාත්‍රිය විය.

යසෝදානි නිවසේ සුදු වැලි මිදුලේ කොටු පනිමින් සිටියා ය. මල්ලී පසෙකට වී කෝම්පිට්ටු ඉව්වේ ය. සීයා පිල උඩ වාඩි වී තම මිණිබිරිය තනිව කොටු පනින සැටි බලා සිටියේ ය. කිටියා කොටුවක් ගානේ දුව පැන යමින් ඇයට බාධා කරමින් සිටියේ ය. වරින් වර පැමිණි කළුවා කිටියාගේ වලිගයෙන් ඇද සෙල්ලමට වැටෙන්නට උත්සාහ ගත්තේ ය.

අවසාන කොටුවේ සිටි 'පෙත්තා' ගන්නට නැවෙද්දී යසෝදානි පා පැකිලී වැටුණා ය.

ඈ දැක තිබුණේ සිහිනයකි. අවට වැතිරී හිඳින අම්මා, මල්ලී, සුදු නැන්දා හා තවත් කිහිප දෙනෙක් ඈ දුටුවා ය. එහෙත් ඒ හැම දෙනෙක් ම වාගේ නොනිදා කල්පනා කරමින් සිටින බව ඈ තේරුම් ගත්තා ය.



තවත් කිහිප දෙනෙක් ම බණ මඩුවෙන් පිටත කතා බහ කරමින් සිටියහ. ඔවුන්ට කතා කරන්නට කොතරම් දේ ඇති ද?
සිහිනයේ දුටු සුදු වැලි මිදුල නැත. සීයා ද කළුවා ද ළඟ පාතක නැත. කිටියා නම් වැඩි කලබලයක් නොකර යසෝදානිගේ දෑතට ගුලි වී පන්සලට ආවේ ය. එහෙත් සීයා මෙන්ම 'කළුවා' ද ගෙදර අත හැර ආවේම නැත.

යසෝදානි අම්මාට නොඇසෙන්නට ඉකි ගසා හැඬුවා ය.
වැස්ස නැවතී තිබිණි. යසෝදානි ඒ ගැන සතුටු වූවා ය.

එහෙත් පසුවදා උදෑසන වන විට නැවතත් මහ වැසි පටන් ගෙන තිබිණි. පිරිමි උදවිය පවා නිවෙස්වල රැඳී සිටීම නුසුදුසු බව ග්‍රාමසේවක මහතා තරයේ ම කියා සිටියේ ය.
සීයා නිවසින් ඉවත් නොවීම කාටත් ප්‍රශ්නයක් විය.

''කෝ... මමවත් ගිහින් රංබණ්ඩා උපාසක මහත්තය එක්කන් එන්ඩ...''

ලොකු හාමුදුරුවෝ නොපමාව-වැස්සේ ම පිටත්ව ගියේ යසෝදානිගේ සීයා කැඳවාගෙන එන්නට ය.

අවසානයේ දී සීයා ද පන්සලට පැමිණ සිටියේය. ඔහුගේ ඇඳි පුටුව දෙපසින් ලී දඬු දෙකක් ගැට ගසා තිබිණ. තාත්තාත්, පියසේන මාමාත් තවත් කිහිප දෙනෙකුත් සීයා වාඩි ගත් පුටුව ඔසවාගෙන

ආහ.

සීයා පුටුවේ වාඩි වී ආවේ ඉතා අකමැත්තෙනි. හරියට මුළු ලෝකයම හා තරහ වූවා සේ ය.

ඉතා දීර්ඝ වූ දෙවෙනි රාත්‍රිය ගෙවී යමින් තිබිණි.

පොද වැස්සේ හඬ අභිබවමින් හදිසියේ ඇසුණු ඒ මහා බියකරු හඬින් නින්දත් නොනින්දත් අතර හුන් සියල්ලෝ අවදි වූහ.

සියළු දෙනාම නිහඬව ම අසා සිටියහ. විනාඩි දෙක තුනක් තිස්සේ ඒ අද්භූත හඬ දෝංකාර දුන්නේ ය. කතා කරන්නට කා ළඟවත් වචන තිබුණේ නැත.

ලොකු හාමුදුරුවන් වහන්සේ සන්සුන් ගමනින් බණ මඩුවට වැඩියහ.

''දෝතළු කන්ද කඩන් වැටුණා. ඕව ඔහොම තමයි. හැම දෙයක්ම අස්ථිරයි. හැම දෙනාගෙම ජීවිත බේරුණු එක ලොකු වාසනාවක්...''

**ISBN 978-955-590-102-4**

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

*දුරකථනය: 011-2696771-3* *ෆැක්ස්: 011-2694754*